(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 4(1).]**

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ජූනි 08 අඟහරුවාදා**

---

**2021 ජූනි 22 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,—දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනාව,— මෙයට පෙර යෝජනාව මඟින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රු.1,000,000,000,000කට නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්යය සඳහා (417 වැනි අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වැනි වගන්තියට යටත්ව අවශ්‍ය සියලුම අවසර මුදල් අමාත්‍යතුමාට දීමටත්, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 23 දිනැති අංක 2224/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 23 දිනැති අංක 2224/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වන අධිකාරය වූ) 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) ඊ ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 18 දිනැති අංක 2219/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2021 ජූලි 09 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2020

ගරු හේෂා විතානගේ මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීම,— රටකට සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේ දී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට සුදුසු යාන්ත්‍රණයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2020

ගරු හේෂා විතානගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම,— කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂිකර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගා ජලය විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේ දී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2020

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ආරම්භ කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්හි දී නිරන්තරයෙන්ම ගංවතුරෙන් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2020

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වානිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යෑමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වාභාවික ආපදා අවම කරගැනීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානම් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2020

ගරු හේෂා විතානගේ මහතා,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණයවීම වැළැක්වීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණයවීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශ වන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවැනි වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදාහරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳ විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2020

ගරු හේෂා විතානගේ මහතා,— දහම් පාසැල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ටසම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇතිකිරීම උදෙසා සියලුම දරුවන්ට (11 ශ්‍රේණිය දක්වා) ඔවුන්ගේ ආගමානුකූලව දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2020

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැඟීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුලපිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයන් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව සෘජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයන්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මඟින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයින්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත්වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/2020

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— ශ්‍රී ලංකාව තුළ තැපැල් සේවය ව්‍යාප්ත කොට තිබෙන නමුත්, වර්තමානය වනවිට වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව සඳහා තැපැල් සේවාව විධිමත් කිරීමක් සිදුවී නොමැති හෙයින් ඔවුන් විවිධ අපහසුතාවන්ට ලක් වී සිටින හෙයින් ද, අවුරුදු එකසිය පනහකට ආසන්න කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2020

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය පිළිගැනීම,— ශ්‍රී ලංකා ඉතිහාසයේ ආර්ථික වර්ධනය සඳහා අතිවිශාල දායකත්වයක් සපයන කඳුරට වතු කම්කරුවන් තම අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ ලබාගෙන ඇති හෙයින්, එවැනි අරගලයන්හි දී දිවිපිදූ වෘත්තීය සමිති විරුවන් පොදු දිනකදී අනුස්මරණය කළ යුතු යැයි ශ්‍රී ලංකාවේ ජීවත්වන ඉන්දීය සම්භවයෙන් යුත් කඳුරට ජනතාවගේ දීර්ඝ කාලීන ඉල්ලීම සලකා බලා ඒ අනුව වාර්ෂිකව ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය සැමරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2020

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුලත් ගොවීන්ගේ ගැටලු විසඳීම,— වයඹ පළාතේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් බුලත් වගාවේ නිරතව සිටින අතර, වර්තමානය වනවිට එම බුලත් ගොවීන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් එම තත්ත්වය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පුරන් වූ කුඹුරු අස්වැද්දීම,— රටක සංවර්ධනය සඳහා ආහාරවල සුරක්ෂිතභාවය ඉතා වැදගත් වන හෙයින් වයඹ පළාතේ දැනට පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සඳහා කඩිනම් යෝග්‍ය වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම විසඳීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක අලි-මිනිස් ගැටුම ඉතා ප්‍රබලව දක්නට තිබෙන හෙයින් ඒ සඳහා තිරසර විසඳුමක් ලෙස සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම,— වයඹ පළාතේ විශාල පිරිසක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන හෙයින් ද, එම ගොවි ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන හෙයින් ද, වයඹ පළාතේ කුඩා වැව් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම,— කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බොහෝ ප්‍රදේශවල පුරාවිද්‍යා ස්ථාන රාශියක් තිබෙන හෙයින් අනාගත පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2020

ගරු එච්. නන්දසේන මහතා,— වන සීමා පුළුල් කිරීම හේතුවෙන් ගොවීන්ට වසර ගණනාවක් වගා කළ ඉඩම් අහිමි වීමෙන් සිදුවන හානිය වළකාලීම,— 2001.08.10 දින වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලැබූ 5/2001 චක්‍රලේඛය පදනම් කර ගනිමින් වන සීමා පුළුල් කිරීමේදී දීර්ඝ කාලයක් පුරාවට වගා කරන ලද ගොවි බිම්, වන සීමාවට ඇතුළත්වීම හේතුවෙන් එම ගොවි ජනතාවට අසාධාරණයක් සිදුවූ හෙයින් ද, අදාළ නිලධාරීන් වගකීමෙන් කටයුතු කර නොමැති හෙයින් ද, මෙම තත්ත්වයට මුහුණ පා සිටින අසරණ ගොවි ජනතාවට සාධාරණය ඉටුකර දීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2020

ගරු එච්. නන්දසේන මහතා,— රජයේ පාසල්වල වසර 15කට අධික කාලයක් ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටි සිවිල් ආරක්ෂක නිලධාරීන් හට ගුරු පුහුණුව ලබා දී ගුරු සේවයට ඇතුළත් කර ගැනීම,— ත්‍රස්ත ප්‍රහාර උත්සන්නව පැවති සමයේ දී තර්ජිත ගම්මානවල පිහිටි පාසල්වල විශාල ගුරු හිඟයක් පැවති හෙයින්, පාසල් දරුවන් සඳහා ඉගැන්වීම් කටයුතු වර්තමානය දක්වාම සිවිල් ආරක්ෂක නිලධාරීන් පිරිසක් විසින් සිදු කරනු ලැබූ හෙයින් ද, උතුරු නැගෙනහිර පළාත්වල එවන් නිලධාරීන් ගුරු සේවයට ඇතුළත් කරගත් හෙයින් ද, උතුරු මැද පළාතේ සිවිල් ආරක්ෂක නිලධාරීන් ද ගුරු සේවයට ඇතුළත් කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් නිසා ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වා ගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූණු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු  නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළු ලෑලි,  සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි  සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහලම ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට  මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ  ප්‍රමිතියකින් පැවැත්විය  යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය

කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමුපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමුපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමුපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමුපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමුපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමුපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමුපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමුපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන් ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලීසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල සූරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අළෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සෑදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය

ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතා කර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සැදීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති "සිලෝන් ස්පයිස්" යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අළෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ලබාදීම සහ ඒ සමඟම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී

වන්දි ලබාදෙන රක්‍ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මඟින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/2020

ගරු එච්. නන්දසේන මහතා,— වසර 40කට අධික කාලයක් පුරා ස්ථිර නිවාසවල පදිංචිව සිටින (බලපත්‍ර සහිත හෝ රහිත) පදිංචිකරුවන් සඳහා ඉඩම්වල අයිතිය ලබාදීම,— වසර 40කට අධික කාලයක් ස්ථිර නිවාස ඉදිකර ගනිමින් පදිංචිව සිටිය දී පසුකාලීනව වනජීවී ප්‍රදේශ ලෙස ගැසට් කිරීම හෝ ජනතාව දැනුවත්කිරීම නිසා ජයභූමි ඔප්පු හෝ වෙනත් දීමනා පත්‍ර ලැබී තිබුණ ද, සියලුම සංවර්ධන කටයුතු අත්හිටුවීම නිසා පදවිය - කැබතිගොල්ලෑව මාර්ගයේ නිවාස, නගරය හා මූලික රෝහල් භූමිය සහ මිහින්තලය අංක 564 පොතාන තුලානේ නිවාස, සින්නක්කර හෝ පිඹුර සහිත කුඹුරු ඉඩම් හිමි පදිංචිකරුවන්ට තදබල අසාධාරණයක් සිදු වී ඇති හෙයින්, මෙම ඉඩම් නිදහස් කර දීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/2020

ගරු එච්. නන්දසේන මහතා,— උතුරු මැද පළාතේ සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම,— මූලය හඳුනා නොගත් වකුගඩු රෝගීන් බහුල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති උතුරු මැද පළාත තුළ වර්තමානය වනවිට ජල පෙරණ සවිකරමින් තිබෙන හෙයින් ද, එනිසා වැඩිවන රෝගීන් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවක් දක්නට ඇති හෙයින් ද, සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම කඩිනම් කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් ඇති කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/2020

ගරු එච්. නන්දසේන මහතා,— සියලුම ගම්මාන සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග ස්ථිර මාර්ග ලෙස සංවර්ධනය කිරීම,— දුෂ්කර ප්‍රදේශවල බොහෝ ගම්මාන සඳහා ඇත්තේ එකම පිවිසුම් මාර්ගයක් පමණක් හෙයින් ද, වසර ගණනාවකින් ඒවා සංවර්ධනය කර නොමැති හෙයින් ද, මෙම සියලුම පිවිසුම් මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/2021

ගරු රෝහණ බංඩාර මහතා,— දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පණගැන්වීම,— වර්තමානය වනවිට දේශීය බීජ නිෂ්පාදනය විදේශීය සමාගම්වල ග්‍රහණයට හසු වී තිබෙන හෙයින් ද, එමගින් දේශීය කෘෂි කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල අත් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම,— රටක අනාගත පරපුරට එම රටේ ඉතිහාසය ඉතා වැදගත් වන හෙයින් ද, වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන්ට සිදු වන හානි සම්බන්ධ සිදුවීම් රාශියක් වාර්තා වී ඇති හෙයින් ද, අනාගත පරපුර වෙනුවෙන් වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම,— වයඹ පළාතේ සැළකිය යුතු පිරිසක් කෘෂි කර්මාන්තයේ නිරත වන හෙයින් ඔවුන්ගේ හෙට දවසේ සුරක්ෂිතතාවය සඳහා අමිල සම්පතක් වන එම පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— එල්ලේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— එල්ලේ ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ක්‍රීඩාව වන හෙයින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ක්‍රීඩා සංගම්වල කටයුතු විධිමත් කිරීම,— වර්තමානය වනවිට ක්‍රීඩා සංගම්වල නිලතල දරන පුද්ගලයන් ක්‍රීඩාවේ ප්‍රගමනයට කටයුතු කිරීම පසෙක දමා සිය පෞද්ගලික අරමුණු සඳහා කටයුතු කරන හෙයින් ක්‍රීඩා සංගම්වල කටයුතු නිරන්තරයෙන් විමර්ශනයට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නගරවලින් පිටතට බන්ධනාගාර රැගෙන යාම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ බොහෝ බන්ධනාගාර නගර ආශ්‍රිතව පිහිටා තිබෙන හෙයින් ද, ඒවා තුළ දැඩි තදබදයක් පවතින හෙයින් ද, මෙම බන්ධනාගාර නගරවලින් පිටතට රැගෙන ගොස්, එම පරිශ්‍රවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/2021

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද නියෝග අවලංගු කිරීම,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 සහ 3 වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය විසින් සාදන ලදුව, 2020 අප්‍රේල් 11 දිනැති අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග අවලංගු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් නව ජාතික ආදර්ශ පාසලක් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ වාසය කරන ජන වර්ග අතර ජාතික ඒකාබද්ධතාවය ගොඩනැංවීම සඳහා සෑම ජන වර්ගයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට භාෂාත්‍රයෙන් අධ්‍යාපනය ලැබිය හැකිවන පරිදි නේවාසික පහසුකම් ද සහිතව අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් සංවර්ධනය කර නව ආදර්ශ ජාතික පාසලක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— මන්නාරම-අනුරාධපුර මාර්ගය සංවර්ධනය කොට යළි විවෘත කිරීම,— තිස් අවුරුදු යුද සමයේ දී වසා දැමුණු අනුරාධපුර සිට ඇලයාපත්තුව, පේමඩුව, මන්නාරම් හංදිය, සිලාවතුර සහ මන්නාරම දක්වා දිවෙන අබලන් තත්ත්වයේ පවතින ප්‍රධාන මාර්ගය, මන්නාරම සිට භාණ්ඩ සහ මාළු ප්‍රවාහනයට ද, ගමනාගමනයට මෙන්ම කොළඹ ඇතුළු ප්‍රධාන නගර සියල්ලටම ළඟාවිය හැකි පහසුම සහ කෙටිම මාර්ගය වන හෙයින් ද, අනුරාධපුර හා මන්නාරම දිස්ත්‍රික්ක අතර ඍජු සබඳතා මෙන්ම ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කරන හෙයින් ද, මේ සම්බන්ධව පුළුල් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකොට මාර්ගය සංවර්ධනය කර කඩිනමින් යළි විවෘත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/2021

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/2021

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි තේ කර්මාන්ත ක්‍රමය වෙනුවට කුඩා තේ වතු ක්‍රමයක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ තේ වගාව, වැවිලි ක්‍රමයට අයත් තේ වතු හා කුඩා තේ වතු ක්‍රමයට අයත් තේ වතු ලෙස දෙයාකාර වන හෙයින් ද, මින් වැවිලි ක්‍රමය මේ වන විටත් බිඳවැටෙමින් පවතින හෙයින් ද, වතු වැවිලි ක්‍රමය මඟින් සිදු කරන තේ වගාව, කුඩා තේ වතු ක්‍රමය දක්වා වෙනස් කොට එම වතුවල සේවය කරන කම්කරුවන්, කුඩා තේ වතුවල හිමිකරුවන් බවට පත් කොට ඒවා දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/2021

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— මහවැලි ගොවිපොළ ජාලය ශක්තිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුව උදෙසා දැවැන්ත ජවයක් ලබා දෙන මහවැලි යෝජනා ක්‍රමය මඟින් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින ගොවිපොළ රජය විසින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— කුඩාවිලච්චිය වැව කඩිනමින් සංවර්ධනය කර මහවිලච්චිය, තන්තිරිමලය, ඇලයපත්තුව, නොච්චියාගම ආදී ප්‍රදේශවලට පානීය ජලය ලබාදීම,— අනුරාධපුර දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශයක් වන මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ මහවිලච්චිය ගොවි ව්‍යාපාරය හැර තන්තිරිමලය, දුණුමඩලාව, කඳුරුපිටිය වැනි ප්‍රදේශ ප්‍රධාන වශයෙන් අහස් දියෙන් හේන් ගොවිතැන් කරන හෙයින් ද, පිරිසිදු පානීය ජලය නොමැතිවීම හේතුවෙන් කුඩා දරුවන් පවා වකුගඩු රෝග සහ වෙනත් රෝග ගණනාවකට ගොදුරු වී ඇති හෙයින් ද, මෙම තත්ත්වයට විසඳුමක් ලෙස ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඒකාබද්ධව සැලසුම් කර ඇති "විසල් අනුරාධපුර උතුර" හා "විසල් ත්‍රිකුණාමලය" ජල සම්පාදන ව්‍යාපෘති සඳහා

මෙතෙක් අනුමතිය ලැබී නොමැති හෙයින් ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි කුඩාවිලච්චිය වැව සංවර්ධනය කිරීම මඟින් මෙම ජල සම්පාදන ව්‍යාපෘතියට අවශ්‍ය ජලය ලබාගත හැකි හෙයින් ද, කුඩාවිලච්චිය වැව කඩිනමින් සංවර්ධනය කර මහවිලච්චිය, තන්තිරිමලය, ඇලයපත්තුව, නොච්චියාගම ආදී ප්‍රදේශවලට පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියක් රජය විසින් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— හබරණ නගරය කේන්ද්‍රීය සංචාරක කලාපය සංවර්ධනය කිරීම,— ලොව පුරා සංචාරක ආකර්ෂණය දිනාගත් සුප්‍රසිද්ධ හබරණ නගරයේ ප්‍රධාන සංචාරක නැරඹුම් ස්ථාන ලෙස මින්නේරිය, රිටිගල හා හබරණ වනාන්තරය හැඳින්විය හැකි හෙයින් ද, මෙහිදී වන අලින් නැරඹීමේ අවස්ථාව උදාවීම සංචාරක ආකර්ෂණයට ප්‍රධානතම හේතුවක් වන හෙයින් ද, සංචාරක කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රයන් එනම් හෝටල් සහ නවාතැන් පහසුකම්, නිවෙස්වල නතරවීම්, සෆාරි, විවිධ වෙළඳාම්, ත්‍රිරෝද රථ සේවය යනාදිය තම ජීවනෝපාය කරගත් පවුල් 15000ක, 35000ක් පමණ වන ජනතාවක් මෙම ප්‍රදේශයේ වාසය කරන හෙයින් ද, අප රටට විශාල විදේශ විනිමයක් මෙම කර්මාන්තයෙන් උපයාගත හැකිවන හෙයින් ද, හබරණ නගරය කේන්ද්‍රීය සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව සම්බන්ධ කොටගත් ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් රජය විසින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/2021

ගරු රෝහණ බංඩාර මහතා,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ලබාදීම,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී සිටින හෙයින්, මෙම සේවයේ නියුතු නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කිරීම,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විදේශ රටවල දී විවිධ දුෂ්කරතාවලට මුහුණපාන හෙයින් ද, මෙම ශ්‍රමිකයින්ට එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් ඉතා අල්ප සේවාවක් සිදුවන හෙයින් ද, ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු (දුක්ගන්නාරාල කෙනෙකු) රජය විසින් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ආනවිළුන්දාව තෙත් බිම ආරක්ෂා කිරීම,— ජාත්‍යන්තර රැම්සා සම්මුතිය මඟින් තෙත් බිමක් වශයෙන් නම් කර තිබෙන ආනවිළුන්දාව තෙත් බිම අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම,— පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමට රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන් සිය නිවෙස්වල නිරෝධායනයට ලක්කිරීම,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විදේශයන්හි සිය රැකියා අහිමි වී ඉතාමත් දුක්ඛිත කාල පරිච්ඡේදයක් ගත කර මෙරටට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කිරීම සඳහා රජය විසින් හඳුන්වා දී ඇති ක්‍රමවේදය මෙම අවස්ථාවේ දී ඔවුන්ට දැරිය නොහැකි වැය බරක් වන හෙයින් නියමිත කාල සීමාව තුළ සිය නිවෙස්වල නිරෝධායනය වීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය සංවර්ධනය කිරීම,— අතීතයේ සිට සිංහල, දෙමළ හා මුස්ලිම් ඇතුළු විවිධ ජන කොටස් අනුරාධපුර නගරයේ වාසය කර ඇති හෙයින් ද, 1983 කළු ජූලිය ඇතුළු විනාශකාරී තත්ත්වයන් හේතුවෙන් අනුරාධපුර නගරාසන්නයේ ජීවත් වූ දෙමළ ජනතාවගෙන් බොහෝ පිරිසක් නගරය අත්හැර ගොස් තිබුණද ඔවුන්ගේ අයිතීන් එලෙසින්ම පැවතිය යුතු වන හෙයින් ද, දමිළ දරු දැරියන් වෙනුවෙන් වෙන් වූ අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය මේ වනවිට අභාවයට යමින් පවතින හෙයින් ද, අනෙකුත් ජන කොට්ඨාස සඳහා වෙන් වූ පාසැල් පවතින්නා සේම දමිළ දරු දැරියන් වෙනුවෙන් අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය සංවර්ධනය කිරීමට අවශ්‍ය තීරණ රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/2021

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,— රජයේ ලියාපදිංචි කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— චිත්‍රපට, ටෙලිනාට්‍ය, වේදිකා නාට්‍ය, සංගීත ක්ෂේත්‍රය යනාදී සියලුම කලා ක්ෂේත්‍ර නියෝජනය කරන ශ්‍රී ලාංකික කලාකරුවන් තම ශ්‍රමය, කාලය සහ හැකියාව වෙනත් රටවලට සාපේක්ෂව ඉතා අඩු මුදලකට ලබාදෙන හෙයින් ද, තම ජීවිතයේ අවසාන කාලය බොහෝ කලාකරුවන් ඉතා දුක්ඛිත, අසරණ සහ අවාසනාවන්ත ලෙස නිමා කරන හෙයින් ද, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන රජයේ වැටුප් නොලබන බොහෝ කණ්ඩායම්වලට එනම් ගොවි විශ්‍රාම වැටුප, ධීවර විශ්‍රාම වැටුප ලබාදෙන ආකාරයට සිනමා කෘති 10 කට වඩා ස්වකීය දායකත්වය ලබාදුන් හෝ වයස අවුරුදු 60 ඉක්ම වූ රංගන ශිල්පීන්, අධ්‍යක්ෂකවරුන්, කැමරා ශිල්පීන්, සහාය අධ්‍යක්ෂකවරුන්, අංග රචනා ශිල්පීන් ද ඇතුළත් වන පරිදි විශ්‍රාම වැටුපක් සහිත සමාජ ආරක්ෂණ ක්‍රමයක් කලාකරුවන්ට ද ලබාදීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/2021

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නැගෙනහිර පළාතේ ස්ථාපිත කර තිබෙන හා විවෘත කිරීමට නියමිත බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් රජයට පවරා ගැනීම,— බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කිසිදු අනුමතියක් ලබාගෙන නොමැති හෙයින් ද, මෙහි ෂරියා නීතිය සම්බන්ධ පාඨමාලා ඉගැන්වීම ඔස්සේ අන්තවාදී මත දරන්නන් බිහිවිය හැකි හෙයින් ද, මෙරට ජාතීන් හෝ ආගම් වෙන්කර විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම හරහා රට බෙදුම්වාදය කරා යොමුවීමේ හැකියාවක් ඇති හෙයින් ද, ආයතනය සම්බන්ධයෙන් පසුගිය පාර්ලිමේන්තුවේ පැවති අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා නිරීක්ෂණ වාර්තාවේ ඒකමතික අවසන් නිර්දේශ අනුව මෙම නීති විරෝධී ආයතනය රජයට පවරා ගත යුතු බව සහ සියලු වැරදිකරුවන්ට කඩිනම් නීතිමය පියවර ගත යුතු බව දක්වා ඇති හෙයින් ද, මෙම ආයතනය රජයට පවරාගෙන එහි මෙරට ජීවත්වන සියලුම ජනවර්ගයන්ට හා ආගම්වලට අයත් දරුවන් හට උසස් අධ්‍යාපනය හැදෑරීමට අවකාශ ලබාදීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/2021

ගරු මයන්ත දිසානායක මහතා,— බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය මැතිවරණ බල ප්‍රදේශයේ අලි-මිනිස් ගැටුම් සහ වන අලින් විසින් සිදුකරන වගා හානි වැළැක්වීම,— ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය මැතිවරණ බලප්‍රදේශයේ, මහවැලි ගම්මාන වන අගලඔය, මිල්ලන්නාව, විරානගම සහ තවත් මහවැලි ගම්මාන කිහිපයක වන අලි තර්ජනය හේතුවෙන් ඉතා වෙහෙස මහන්සියෙන් වගා කළ වගාවන් විනාශවන හෙයින් ද, අවාසනාවන්ත ලෙස ජීවිත අහිමිවන හෙයින් ද, මෙම තත්ත්වයෙන් ඔවුන්ව මුදා ගැනීමට ස්ථිරසාර විසඳුමක් ලබාදීමට හෝ අලි වැටක් සකස් කරදීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/2021

ගරු මයන්ත දිසානායක මහතා,— සියලුම දරුවන් සඳහා දහම් පාසැල් අධ්‍යාපනය ලබාදීම,— බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවීමෙන් ශිෂ්ට සම්පන්න සමාජයක් වෙනුවට අපචාර සහ අපරාධ පිරුණු සමාජයක් බිහිවීමට ඉඩ ඇති හෙයින් දහම් පාසැල් දිනයේ දී උපකාරක පන්ති නවතා දහම් පාසැල් අධ්‍යාපනය අනිවාර්යය කිරීමට ද, දුෂ්කර ප්‍රදේශවල දහම් පාසැල් සඳහා භෞතික සම්පත් ලබාදීමට මෙන්ම දහම් පාසැල් ගුරුවරුන්ගේ සුබසාධනය සඳහා ද, රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/2021

ගරු මයන්ත දිසානායක මහතා,— ත්‍රිරෝද රථ සහ යතුරු පැදි ආශ්‍රිත රැකියා නියුක්තිකයන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම,— ශ්‍රී ලංකාව තුළ ත්‍රිරෝද රථ සහ යතුරු පැදි ආශ්‍රිතව ඍජු සහ වක්‍ර රැකියාවල නියුතු ස්වයං රැකියාලාභින් හට කොවිඩ් - 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන ලබා දුන් ණය සහන වාරිකයට ඉහළ පොළී අනුපාතයක් අය කිරීම හේතුවෙන් ඔවුන් ඉමහත් දුෂ්කරතාවලට මුහුණ දී ඇති හෙයින් ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ රැකියාව සුරක්ෂිත කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/2021

ගරු රෝහණ දිසානායක මහතා,— එළවළු මිලදී ගැනීමේ හා අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තක්කාලි ඇතුළු එළවළු වගාව විශාල වශයෙන් සිදු කරනු ලබන කෘෂිකාර්මික ප්‍රදේශයක් වන හෙයින් ද, එම නිෂ්පාදන එක්රැස් කොට තොග වශයෙන් අළෙවි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති හෙයින් ද, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යේලක්කරය මංසන්ධියේ සිට මාතලේ කුරුණෑගල මාර්ගයේ දකුණු පස පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන එහි එළවළු එකතු කිරීමේ හා අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/2021

ගරු රෝහණ දිසානායක මහතා,— අලි - මිනිස් ගැටුම වළක්වාලීම,— අලි - මිනිස් ගැටුම හේතුවෙන් වනඅලින්ගේ ජීවිතවලටත්, මිනිස් ජීවිතවලට හා ඔවුන්ගේ දේපළවලටත් හානි සිදුවන දිස්ත්‍රික්ක අතරට මාතලේ දිස්ත්‍රික්කය ද අයත් වන අතර මෙම ගැටලුවට විසඳුමක් ලෙස අලිවැටවල් ඉදිකර තිබුනද ගැටලුව විසඳී නොමැති හෙයින් වන උද්‍යාන වශයෙන් නිශ්චිතව හඳුනාගත් ප්‍රදේශ වෙන්කර සියලුම වනඅලින් අල්ලා ඒවාට මුදා හැරීමට ද, එම වන උද්‍යාන වටා විදුලි වැටවල් වෙනුවට පස් බැමි ඉදිකර ඒ මත මාර්ග ඉදිකිරීමට, ශාක වගාකිරීමට හා සංචාරක මධ්‍යස්ථාන ඉදිකිරීමට ද, ලංකාවේ අනෙක් ප්‍රදේශවල ඉදිකර ඇති විදුලි වැටවල් ගලවා ඉවත්කිරීමට ද සහ ඉහත සඳහන් වන උද්‍යාන ඇතුළත වැව් ඉදිකර ඒවාට වාරි ජලය සැපයීමට ද අවශ්‍ය කටයුතු රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/2021

ගරු රෝහණ දිසානායක මහතා,— වන සංරක්ෂණ හා වනජීවී ඉඩම්වලට ගවයන් මුදා හැරීම වැළැක්වීම,— වනජීවී දෙපාර්තමේන්තුවට හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත ඉඩම්වලට ආහාර සඳහා ගවයන් මුදාහැරීම හේතුවෙන් ගොවීන් සහ වනජීවී නිලධාරීන් අතර ගැටලු බොහොමයක් නිර්මාණය වී ඇති හෙයින් ද, මේ සඳහා මෙම ඉඩම්වල පිහිටා ඇති විශාල වෘක්ෂ එලෙසම පවතිද්දී ඉඩම්වලින් කොටසක් ගව පාලනය සඳහා වෙන්කර ඒවායේ වැව් ඉදිකර වාරි ජලය ද සැපයීමෙන් නිරන්තරයෙන් වනඅලින්ගෙන් බැටකන ගොවීන්ව කිරි ගව පාලනයට යොමු කළ හැකි හෙයින් ද, එයින් පරිසර පද්ධතියට කිසිදු හානියක් නොවන හෙයින් ද, එමගින් කිරි සඳහා වාර්ෂිකව විශාල ධනස්කන්ධයක් විදේශ රටවලට ගලායාම වළක්වාගත හැකි හෙයින් ද, කිරි නිෂ්පාදනය හේතුවෙන් රටේ විශාල ආර්ථික ප්‍රගතියක් ඇතිකර ගැනීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/2021

ගරු රෝහණ දිසානායක මහතා,— රිලවුන්ගෙන් හා වඳුරන්ගෙන් සිදුවන හානි වළක්වා ගැනීම,— නිදැල්ලේ හැසිරෙන රිලවුන් හා වඳුරන් නිසා ගොවීන්ගේ එළවළු හා පලතුරු වගාවන් මෙන්ම පොල් වගාවන් විනාශවීම, නිවාස හා දේපල විනාශවීම, ලේනුන් හා ගිරවුන් ආදී සතුන්ගේ කුඩු හා බෙන කඩා පැටවුන් හා බිත්තර කා දැමීම, දෙල් ආදී ගස්වල දලු කා දැමීම හේතුවෙන් එලදාව හීනවීම යනාදී ගැටලු රාශියක් උද්ගතව තිබෙන හෙයින් මෙම හානි වළක්වා ගැනීමේ ජාතික අවශ්‍යතාවය සඳහා විසඳුම් ලෙස මොරගහකන්ද වැනි ජලාශ මධ්‍යයේ පවතින දූපත්වලට මෙන්ම වෙරළ ආශ්‍රිතව පවතින දූපත්වලට රිලවුන් හා වඳුරන් මුදාහැරීම, එම ස්ථාන රිලා හා වඳුරු උද්‍යාන ලෙස නම් කිරීම, අල්ලා ගනු ලබන සතුන් වඳභාවයට පත්කර මුදාහැරීම,

දඹුල්ල හා මැනිං ආදී ආර්ථික මධ්‍යස්ථානවලින් ඉවතලන එළවළු හා පලතුරු රිලා හා වඳුරු උද්‍යානවලට ලබාදීම සඳහා පරිසර සංවිධාන හරහා වැඩපිළිවෙළක් සැකසීම හා මෙම රිලා හා වඳුරු උද්‍යාන නැරඹීමට සුදුසු වැඩපිළිවෙළක් සකසා ඉන් උපයන මුදල් එම උද්‍යාන නඩත්තු කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2021 සැප්තැම්බර් 08 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

37/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාව වෙත ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා වර්තමානයේදී අවශ්‍ය වන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2019.01.01 දිනය වනවිට රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉදිරි වර්ෂවලදී රාජ්‍ය සේවයට බඳවා ගැනීමට යෝජිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව බිහිකර ගැනීම සඳහා රජය සැලසුම් සකස් කර ඇති ආකාරය කෙසේද?

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

275/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ මිදි නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මිදි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිදි ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) මිදි වගාව සඳහා සුදුසු දේශගුණික තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 හා 2019 වර්ෂවලදී ශ්‍රී ලංකාවට මිදි ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව මිදි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී මිදි අපනයනය කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

446/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින් අතරින් මේ වනවිට ධාවනයට යොදවා ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ධාවනයට යොදවා නොමැති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දුම්රිය එන්ජින් ධාවනයට යොදවා නොගැනීමට හේතු කවරේද;

(v) එම දුම්රිය එන්ජින් කඩිනමින් ධාවනයට යොදවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

724/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඖෂධ වෙළඳසැල් (ඔසුසල්) පිහිටා නොමැති බවත්;

(ii) ඉහත දිස්ත්‍රික්කවල ජීවත්වන සාමාන්‍ය ජනතාව ඇතැම් ඖෂධ ලබා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල මේ වනතෙක් රජයේ ඔසුසල් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) එම දිස්ත්‍රික්කවල රජයේ ඔසුසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

820/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම බන්ධනාගාරවල රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව හා මේ වනවිට රඳවා තබා ඇති රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ධාරිතාවය ඉක්මවා රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(v) රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

849/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඳුරුවෙල විකල්ප මාර්ගයේ කි.මී. 0 + 000 සිට කි.මී. 2 + 687 දක්වා වූ මාර්ග කොටස, මංතීරු 4ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට, රජයේ බීජ වී ගොවිපොළට අයත්වන සහ ප්‍රදේශවාසීන් විසින් භුක්ති විඳින ලද ගොඩ ඉඩම්, මඩ ඉඩම්, මුඩු ඉඩම්, ගෙවතු ඉඩම් සහ ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් රජයට පවරාගෙන තිබේද?

(ii) එසේ නම්, එලෙස පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වන්දි මුදලක් ගෙවා තිබේද;

(v) එසේ නම්, ගෙවනු ලැබූ වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් මාර්ග කොටස පුළුල් කිරීම යටතේ මේ වනවිට වැඩ නිම කර ඇති දුර ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

997/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණු පාඨමාලාවන් මෑතකදී හදාරා අවසන්කර ඇති ඩිප්ලෝමාධාරීන් සඳහා මේ වනතෙක් ගුරු පත්වීම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මෑතක සිට ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගුරු හිඟයට පිළියමක් ලෙසද, දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා ද විද්‍යා පීඨවල පුහුණු පාඨමාලාවන් හදාරා අවසන්කර ඇති මෙම ඩිප්ලෝමාධාරීන් සඳහා ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1063/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුම පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වන අලින් පළවා හැරීමට සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම වන අලින් පළවා හැරීමට අදාළ නිලධාරීන්ගේ හිඟය මගහරවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 සැප්තැම්බර් 09 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේදී ඇති වූ නියඟය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ අතරට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් නොවන්නේ නම්, හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ සහන ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ නිකුත් කළ චක්‍රලේඛ;

(ii) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය;

(iii) එම චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ සහනාධාර ගෙවීමට වැය කළ මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) NDR/2018/03 චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

246/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

274/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පාඨමාලාව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) උපාධි පාඨමාලාවකට සමාන මෙම පාඨමාලාවට සිදු කරන ලද සංශෝධන මඟින් ඩිප්ලෝමා පාඨමාලාවක තත්ත්වය දක්වා පහත දමා ඇති බවත්;

(iii) එම පාඨමාලාව නවතා දැමීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව උපාධි පාඨමාලාවක තත්වයට නැවත ලබා දීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ආයුර්වේද ශාස්ත්‍රී උපාධිධාරින්ට අනෙකුත් ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(iii) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම නැවත ආරම්භ කරන්නේද;

(iv) එම පාඨමාලාව නතර කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

444/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය නමින් ආයතනයක් තිබෙන බව දන්නේද;

(ii) එම ආයතනයේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදේශ රැකියා අවස්ථා බෙදා හැරීමේදී එම ආයතනය විසින් වංචා සහ දූෂණ සිදු කරනු ලබන බව දන්නේද;

(iv) එම වංචා සහ දූෂණ වළක්වා ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමිය දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

783/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1989 – 1990 කාල සීමාව තුළ රජයේ ගුරු සේවයට බඳවා ගනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ගුරුවරුන් විශ්‍රාම යාමේ අවධියට ආසන්නව සිටින බවත්;

(ii) එම ගුරුවරු විශ්‍රාම යෑමත් සමඟ ගුරු සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

864/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතු රාජ්‍ය ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය ඔසුසල් පිහිටා නොමැති දිස්ත්‍රික්ක තිබේ නම්, එම දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය රජය සමයේ ගුණත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කළ බව එතුමිය දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කර ඇති ගුණත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ ප්‍රමාණය;

(ii) එම ඖෂධවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඔසුසල් සඳහා කල් ඉකුත් වූ ඖෂධ නිකුත් කිරීමට හේතු;

(ii) එම ඖෂධවල වටිනාකම අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ගනු ලැබූ පියවර;

(iii) වටිනාකම අයකර ගෙන නොමැති සැපයුම්කරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

938/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් "ළඟම පාසල හොඳම පාසල" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්;

(ii) ඒ යටතේ කොළඹ අධ්‍යාපන කලාපය තුළ පිහිටි සුසමයවර්ධන විද්‍යාලය, ශාන්ත අන්තෝනි පිරිමි විදුහල, මහාබෝධි විද්‍යාලය, අනුරුද්ධ බාලිකා විදුහල, ශාන්ත අන්තෝනි බාලිකා (ප්‍රාථමික) විදුහල, මුතුවෙල්ල හින්දු විද්‍යාලය සහ මෝදර ආනන්ද විද්‍යාලය යන විද්‍යාල සංවර්ධනය කිරීම ආරම්භ කළ බවත්;

(iii) ඒ සඳහා පසුගිය රජය විසින් මුදල් වෙන් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ කොළඹ 12-හමීඩ් අල් හුසෛනි විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මුල්ගල තැබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත අ(ii)හි සඳහන් පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

946/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වේලනයිතුරෙයි සිට පුංගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා වන පාලම ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දිගම පාලම්වලින් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ දිග කොපමණද;

(ii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පාලම මතින් ගමන් කිරීම දැඩි අවදානම් සහගත බවත්;

(ii) සාමාන්‍ය ජනතාව සහ වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන මෙම පාලම මතදී බොහෝ අනතුරු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම අනතුරු සිදු වීමට බලපාන හේතු කවරේද;

(ii) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1428/2021

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ආගමික, සංස්කෘතික, සුහසාධන හා වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු පිණිස මාගේ ඉල්ලීම පරිදි එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන 16ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී අනුමැතිය ලබාදී ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන ලද බවත්;

(ii) ඒ අතරින් සංස්කෘතික මධ්‍යස්ථාන 14ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද බවත්;

(iii) එහෙත් මේ වනවිට එම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන නතර වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 20.5ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබේද;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථාන 16 ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 සැප්තැම්බර් 10 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

74/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වී ඇති නමුත් මේ වනතෙක් තීන්දුවක් ලබා දී නොමැති මානව හිමිකම් නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් නඩුවට අදාළ නඩු අංකය සහ පැමිණිලිකරුවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

276/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ කෙසෙල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කෙසෙල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති කෙසෙල් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) කෙසෙල් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව කෙසෙල් ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව කෙසෙල් අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් අපනයන කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

447/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි අතරින් මේ වනවිට ධාවනයට යොදා ගනු ලබන දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ධාවනයට යොදා ගනු නොලබන දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iv) එම දුම්රිය මැදිරි ධාවනයට යොදා නොගැනීමට හේතු කවරේද;

(v) එම දුම්රිය මැදිරි කඩිනමින් ධාවනයට යොදා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

459/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලීටර් 13,200ක ඉන්ධන ප්‍රවාහන ධාරිතාවයකින් යුත් ටැංකි සහිත රථ 05ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය කැඳවනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රථ 05 මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල;

(ii) එක් රථයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල;

(iii) එම රථ මිලදී ගන්නා අවස්ථාව වනවිට එක් රථයක වෙළඳපොළ වටිනාකම;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

745/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගල්නෑව පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැඟිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

867/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 කාලය වන තෙක් ක්‍රියාත්මකව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කින්නියා සංචාරක අධිකරණය, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුද්මය වාතාවරණය හේතුවෙන් තාවකාලිකව වසා දැමූ බවත්;

(ii) ස්ථිර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම අධිකරණ කටයුතු රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව නැවත ආරම්භ කිරීමට පසුගිය වර්ෂයේදී පියවර ගනු ලැබුවද මේ වන තෙක් එම අධිකරණයේ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය අධිකරණයේ ගොනු වන නඩු සංඛ්‍යාව අවම කිරීම සඳහා සහ කින්නියා ප්‍රදේශයේ ජනතාව නඩු කටයුතු වෙනුවෙන් ත්‍රිකුණාමලය වෙත යාමේදී ඇති වන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පාකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය, මාලදිවයින හා මියන්මාරය ඇතුළු 80 කට අධික රටවල් සංඛ්‍යාවක් කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් හදිසි අවස්ථා ආධාර ලබා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ආධාර ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති ආධාරවල ස්වභාවය කෙබඳුද;

(iii) ඉහත සඳහන් ආධාර ඉල්ලූ දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිචාර දක්වා තිබේද;

(v) එසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාරය කවරේද;

(vi) මේ දක්වා සහන ලැබී ඇති රටවල් 80 ට මෙන් ශ්‍රී ලංකා රජයට සහන ලැබී නොමැති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

881/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති යුදමය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවර වරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1082/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම සේවකයන් අතරින් මේ වනවිට කොවිඩ්-19 රෝගය වැළඳී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවකයන්ට කොවිඩ්-19 රෝගය වැළඳීම එරට සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලබන දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් හැර වෙනත් කුළුබඩු වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 සැප්තැම්බර් 21 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

76/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වී ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වීම සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

347/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති, ඉඩම සඳහා ඔප්පු නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

493/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයේ, මධ්‍යම රජයට, පළාත් සභාවට සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල දිග ප්‍රමාණය කිලෝ මීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත මාර්ග අතරින් මේ වනවිට අබලන් වී ඇති මාර්ගවල දිග ප්‍රමාණය ඉහත සඳහන් එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයට අයත් සියලුම මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාදු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

754/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

822/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින විශාල පිරිසකගේ ඉඩම් සඳහා ඔප්පු නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල්පතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුදෙනියාය ගම්මානයේ ජනතාව මේ වනවිට අවුරුදු 50කට ආසන්න කාලයක් එහි පදිංචිව සිටින බවත්;

(ii) ඔවුන්ගේ ඉඩම් සඳහා මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉරුදෙනියාය ගම්මානයේ පදිංචිව සිටින ජනතාවගේ ඉඩම් සඳහා ඔප්පු ලබා දෙනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1203/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ—

(i) මහා වාරිමාර්ග යටතේ වැව් 14ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 126,242ක් පමණ වන බවත්;

(ii) මධ්‍ය වාරිමාර්ග යටතේ වැව් 83ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 29,775ක් පමණ වන බවත්;

(iii) පළාත් වාරිමාර්ග යටතේ වැව්, 3,019ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 106,185ක් පමණ වන බවත්;

(iv) ඉහත වැව් බොහොමයක මේ වනවිට රොන් මඩ තැන්පත් වී ඇති අතර සැල්වීනියා හා ජපන් ජබර ආදී විවිධ ජලජ පැළෑටි වැවී එම වැව් ගොඩවීමෙන් ඒවායේ ජල ධාරිතාවය අඩු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරිම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) සැල්වීනියා හා ජපන් ජබර උපයෝගී කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සිට මේ වනතෙක් හඳුනාගෙන ඇති, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති අධි අවදානම් නිවාස සංඛ්‍යාව;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේදී ප්‍රමාදයක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?